Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# අම්බලන්ගොඩ නගර සභාව

## රියදුරු, වැඩ ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා ලියාපදිංචි කර ගැනීම

අම්බලන්ගොඩ නගර සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත රියදුරු කාර්ය ඉටුකිරීමට පුද්ගලයින් 05 දෙනෙකු, වැඩ ක්ෂේත්‍ර කම්කරු කාර්ය ඉටු කිරීමට පුද්ගලයින් 15 දෙනෙකු, සෞඛ්‍ය කම්කරු කාර්ය ඉටු කිරීමට පුද්ගලයින් 25 දෙනෙකු ලියාපදිංචි කර ගැනීම සඳහා පහත සුදුසුකම්ලත් අයගෙන් 2019 මාර්තු 31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *මූලික සුදුසුකම් :*

i. ශ්‍රී ලාංකීය පුරවැසියකු වීම,
ii. වයස අවු. 18-45 ත් අතර වීම (අයදුම්පත් කැඳවන අවසාන දිනට)
අම්බලන්ගොඩ නගර සීමාව තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම් :*

| *තනතුර* | *සුදුසුකම්* | *දෛනික දීමනාව* |
|---|---|---|
| 1 රියදුරු | • දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ ඕනෑම විෂයන් හයක් සමත්වී තිබිය යුතුය.<br>• මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය සහ නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.<br>• ට්‍රැක්ටර් රථ පැදවීමේ සුදුසුකම හා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. | රු. 1,250 |
| 2. වැඩ ක්ෂේත්‍ර කම්කරු | • 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම | රු. 1, 200 |
| 3. සෞඛ්‍ය කම්කරු | • 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. | රු. 1, 200 |

03. *සාමාන්‍ය කොන්දේසි :*

මෙම තනතුර හුදෙක්ම නගර සභාවේ කටයුතු කාර්යක්ෂමව හා බාධාවකින් තොරව පවත්වාගෙන යාමේ කඩිනම් අවශ්‍යතාවය සලකා බලා තාවකාලිකව දෛනික සේවයට ගෙවීමේ පදනම මත පමණක් ලියාපදිංචි කිරීමක්වන අතර මෙය නගර සභාවේ හෝ වෙනත් රජයේ කිසිදු ආයතනයක ස්ථිර තනතුරක් සඳහා හිමිකමක් නොවේ.

මෙම ලියාපදිංචි කර ගැනීම වසරක කාල පරිච්ඡේදයක් සඳහා පමණක් වලංගු වේ.

එක් එක් දිනය සඳහා සේවාව ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් එදින පෙරවරුවේ හෝ ඊට පෙර දින පස්වරුවේ දැනුම් දීම් සිදු කරන බැවින් පැය 02 ක කාලයක් තුළ දී මෙම ආයතනයට සේවයට වාර්තා කිරීමට හැකියාව තිබිය යුතුය.

04. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

මේ සමග ඇති ආකෘතිය අනුව සකසන ලද අයදුම්පත්‍රය ''සභාපති'' නගර සභාව, අම්බලන්ගොඩ, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

''............................................... තනතුර සඳහා ලියාපදිංචි කර ගැනීමේ අයදුම්පත්‍රය'' ලෙස අයදුම් කරන තනතුර අයදුම්පත්‍රයේ ඉහලින් පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍ර සමග පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතික,
3. වලංගු රියැදුරු බලපත්‍රය (රියදුරු තනතුර සඳහා පමණි),
4. පදිංචිය හා චරිතය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම ලියාපදිංචි කර ගැනීම අවලංගු කර ගැනීම, ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති සතු වේ. අසම්පූර්ණ අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නීතිඥ ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2019 පෙබරවාරි මස 20 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

යොමු අංකය :
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අම්බලන්ගොඩ නගර සභාව***

*................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම:————————.
02. මුලකුරු සමග නම:————————.
03. ස්ථිර ලිපිනය:————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
05. උපන් දිනය : වර්ෂය:———— මාසය:———— දිනය :————
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————————.
07. ජාතිය:————————.
08. ආගම:————————.
09. විවාහක/අවිවාහක බව:————————.
10. ස්ත්‍රී/පුරුෂ භාවය:————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් ඒ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:————————.
12. දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය:————————.
13. අධ්‍යාපන සුදුසුකම්:————————.

(I) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම්:————————————

15. වෙනත් සුදුසුකම්:————————————

16. සේවා පළපුරුද්ද:————————————

17. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලැබ උසාවියකින් වරදකරුවෙකු වී තිබේද?:————————————

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. සාවද්‍ය තොරතුරු සපයා තිබුණහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව අපේක්ෂකත්වය අවලංගු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අණාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව බවත් දනිමි.

————————————;

අයදුම්කරුගේ අත්සන

දිනය :————————————